**සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.227,121 ක හිඟයක් වූ අතර, පූර්ව වර්ෂයේ එයට අනුරූප හිඟය රු.713,250 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.486,129 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා හේතු වූයේ පුද්ගල පඩිනඩි වියදම් අඩු වීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘතිවල හෝ ප්‍රාග්ධන කටයුතුවල ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනයට සපයා ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) ස්ථාපිත කිරීම, අවශ්‍ය දත්ත ජනගහනය, දත්ත සත්‍යාපන ක්‍රියා පටිපාටි, PostgreSQL දත්ත සමුදායන් සඳහා සේවාදායකත්වය (CrossplatForm Client for PostgreSQL databases), තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම, ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම, සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියේ (SRIS) දෛනික මෙහෙයුම් සඳහා සහභාගි වීම, විධිමත් සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම, කාර්යාලීය පරිසරය සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, සමාජ ලියාපදිංචි | සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතියෙහි (SRIS) සේවාදායක සහ සේවාලාභී මෙහෙයුම් යන දෙකටම ආපදා ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමට මූලික පියවර ගෙන ඇත. දැනට සමාජ ලියාපදිංචි තොරතුරු පද්ධතිය (SRIS) සංවර්ධකයා සමග වසරක කාලයක් සඳහා නඩත්තු ගිවිසුම යටතේ පවතින අතර, කාලසීමාව අනුව දැනුම හුවමාරු කෙරේ.<br>සංවර්ධිත ජංගම යෙදුම මත පදනම්ව, නියමු දත්ත රැස්කිරීම සහ සත්‍යාපන වැඩසටහන තවමත් සිදු කෙරෙමින් පවතී. නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ මඩු මේ වන විටත් දත්ත එක්රැස් කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය එම ක්‍රියාවලිය සිදු කරමින් | සුභසාධන ප්‍රතිලාභ මණ්ඩල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තොරතුරු පද්ධතිය (SRIS) සිට ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියට (IWMS) මාරු වීම, ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියේ (IWMS) කාර්යයන් සම්පූර්ණ කිරීම සහ ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියේ (IWMS) අධීක්ෂණ පද්ධති පිහිටුවීම යනාදී උපායමාර්ග ස්ථාපිත කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, මෙම උපායමාර්ග සැලැස්මට අනුව සංවර්ධනය කර නොතිබුණි. | පවතී. එකතු කරන ලද දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමේ ක්‍රියාවලිය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත දැනටමත් නියැදි යවා ඇත.<br>වර්තමානයේ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයෙහි (WBB) දැවැන්ත ව්‍යුහාත්මක වෙනසක් සිදු වෙමින් පවතී. මෙම ක්‍රියාවලිය අවසන් වූ පසු සභාපතිවරයා පත් කරනු ලබන අතර, ඒ අනුව අනෙකුත් පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ. බඳවා ගැනීම් පමණක් නොව අනෙකුත් කාර්ය පරිපාටි තීරණ ද, ඉහළ අධිකාරීත්වයේ අධීක්ෂණය යටතේ ගනු ලැබේ. සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ (WBB) ස්ථානය ''මෙහෙවර පියස'' වෙත මාරු කිරීම ඉහළ අධිකාරීත්වය විසින් අවලංගු කර ඇත.<br>ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතිය (IWMS) මාස 08 ක් ඇතුළත භාර දීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව වූ 17 හා සසඳන විට 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සත්‍ය සේවක සංඛ්‍යාව 09 ක් විය. එබැවින්, තනතුරු 08 ක් පුරප්පාඩුව පැවති අතර, සියලුම සේවකයන් වැඩබලන, ද්විතීයන පදනමින් සහ තාවකාලික පදනමින් බඳවාගෙන තිබුණි. එමෙන්ම, මණ්ඩලය 2016 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණ ද, 2021 දෙසැම්බර් 31 දින දක්වාම නිසි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | 2019 නොවැම්බර් මාසයේ සිට අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සභාපති සහ අනෙකුත් කොමසාරිස්වරුන් පත් කිරීම සම්බන්ධයෙන් අදාළ බලධාරීන් තීරණයක් ගෙන නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සභාපතිවරයෙකු නොමැතිව අනෙකුත් පුරප්පාඩු බඳවා ගැනීම අපගේ පාලනයෙන් ඔබ්බට සිදු විය. එම හේතුව නිසාම, වැඩබලන සහ ද්වීතියන පදනම යටතේ බඳවාගෙන ඇති සීමිත සංඛ්‍යාවකින් මණ්ඩලය සිය මෙහෙයුම් සිදු කරයි. මණ්ඩලයේ සංවිධානය/ සංයුතිය, ප්‍රතිව්‍යුහගත කිරීම දැනටමත් ආරම්භ කර ඇත. ක්‍රියාවලිය අවසන් වූ පසු සභාපතිවරයා පත්කර අවශ්‍ය අනෙකුත් බඳවා ගැනීම් ඒ අනුව සිදු කෙරේ. | අදාළ නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |